# CENTRE FOR MONITORING ELECTION VIOLENCE
# මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය
# தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

105 - 5th Lane, Colomo - 03, Sri Lanka
Tel: +94 11 2564404, Fax: +94 11 4722632
E-mail: cmev@cpalanka.org Website: http://cmev.wordpress.com

## දකුණු පළාත් සභා ඡන්ද විමසීම - 2009

### මාධ්‍ය නිවේදනය - අංක 03

**2009- ඔක්තෝබර් 04**

**2009 ඔක්තෝබර් 4 කොළඹදීය,** CMEV ආයතනයට වාර්තා වූ සමස්ථ සිද්ධීන් සංඛ්‍යාව 63 න් වන අතර ඉන් 17 ක් බරපතල සිද්ධීන් ලෙසත් 46 ක් බරපතල නොවන සිද්ධීන් ලෙසත් වර්ගීකරණය කර තිබේ. ගාල්ල දිස්ත්‍රික්කයෙන් වාර්තා වන ප්‍රචණ්ඩක්‍රියා සිදුවීම් ඉහල යමින් පවතී. බරපතල සිදුවීම් 17 න් 11 ක්ම වාර්තා වී තිබෙන්නේ ගාල්ල දිස්ත්‍රික්කයෙන් වන අතර සමස්ථ සිද්ධීන් 63 න් 28 ක්ම වාර්තා වී ඇත්තේ ද එම දිස්ත්‍රීක්කයෙනි. පිළිවෙලින් ප්‍රචණ්ඩ ක්‍රියා 22න් සහ 13 ක් හම්බන්තොට සහ මාතර යන දිස්ත්‍රික්ක දෙකෙන් CMEV ආයතනයට වාර්තා වී ඇත.

### පක්ෂ අභ්‍යන්තර ගැටුම් (එ.ජ.නි.ස.)

2009 ඔක්තෝබර් 02 වන දින එ.ජ.නි.ස. ගේ අපේක්ෂක සජින් ද වාස් ගුණවර්ධන මහතාගේ ආධාරකරුවන් පිරිසක් එම පක්ෂයේම පළාත් සභා අපේක්ෂක නිශාන්ද මුතුහෙට්ටිගමගේ මහතාගේ ආධාරකරුවන් පිරිසකට ගාල්ල දිස්ත්‍රික්කයේ අහංගම පොලිස් බල ප්‍රදේශයේදී පහරදීමේ චෝදනාවක් ඇත. මේ පිලිබඳව පැමිණිල්ලක් (EIB/76/11) දරණ අංකය යටතේ අහංගම පොලිසියට V. හිමාල් කුමාර මහතා විසින් කර ඇත. තවද මෙකී චෝදනා ලැබ තිබෙන සජින් ද වාස් ගුණවර්ධන මහතාගේ ආධාරකරුවන් විසින් කඩු සහ පොලු වලින් අදාල පිරිසට පහර දී ඇති අතර නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතාගේ ආධාරකරුවෙකු වන දයා හේමන්ත මහතාව පැහැරගෙන ගොස් රුපියල් 1700/- ක මුදලක් මංකොල්ල කා ඇති බවට ද චෝදනා කෙරේ.

2009 ඔක්තෝබර් 03 වැනි දින CMEV මැතිවරණ නිරීක්ෂක කරාපිටිය රෝහලට ගිය අතර මෙහිදී මෙම සිද්ධයෙන් තුවාල ලැබූ ඩී.එච්. කුමාර සහ පී.එම්.එල්. සෙනෙවිරත්න යන අය ප්‍රතිකාර සඳහා රෝහල් ගතකරතිබූ බව සහතික කරන ලදි. CMEV ආයතනය මගින් අහංගම පොලිසියේ ස්ථානාධිපති තුමාගෙන් මේ පිලිබඳව විමසූ අතර ඔහු පවසා සිටියේ වැඩිදුර පරීක්ෂණ පැවැත්වෙන බවත් මේ වනතෙක් කිසිවෙකුත් අත්අඩංගුවට ගෙන නොමැති බවත්ය.

### ජනතා විමුක්ති පෙරමුණේ ආධාරකරුවන් 03 කුට පහරදීම - දෙනියාය

2009 ඔක්තෝබර් 03 වැනි දින අලුයම 1.00 ට පමණ එ.ජ.නි.ස. අපේක්ෂක සරත් වීරවංශ මහතාගේ (අපේක්ෂක අංක 5) ආධාරකරුවන් පිරිසක් විසින් ජනතා විමුක්ති පෙරමුණේ අපේක්ෂක ප්‍රියන්ත රාජපක්ෂ (අපේක්ෂක අංක 19) මහතාගේ ආධාරකරුවන් වන රංජිත් නිශාන්ත, ජිනදාස, එල්.කේ. දයානන්ද යන අයට පහර දී ඇත. ජිනදාස මහතාගේ හිස තුවාල වී ඇති අතර රංජිත් නිශාන්ත යන

අයගේ පාදයකට තුවාල වී ඇත. මොවුන් ප්‍රතිකාර සඳහා මොරවක දිසා රෝහලට ඇතුලත් කර ඇත.

CMEV ආයතනය මගින් ප්‍රියන්ත රාජපක්‍ෂ මහතාගෙන් මේ පිළිබඳ විමසීමක් කල අතර ඔහු ප්‍රකාශ කර සිටියේ ඔක්තෝබර් 05 වැනි දින සනත් ජයසූරිය ක්‍රීඩාංගණයේ පැවැත්වීමට නියමිතව තිබූ ජ.වි.පෙ. ප්‍රචාරක රැස්වීමක පොස්ටර් අලවිමින් සිටියෙදී මොරවක නගරයේදී මෙකී පහර දීමට ලක් වූ බවයි. ඔහු චෝදනා කරසිටියේ එ.ජ.නි.ස. යේ අපේක්‍ෂකයන් වන විරවංශ මහතා සහ චන්දිම රාසපුත්‍ර (අපේක්‍ෂක අංක 12) මහතාගේ ආධාරකරුවන් පිරිසක් වාගන 4 කින් පැමිණ මෙම ආධාරකරුවන්ට පහරදුන් බවයි.  ඔහු තවදුරටත් ප්‍රකාශ කර සිටියේ පහරදුන් පුද්ගලයින් පිස්තෝලයක් පෙන්වා තර්ජනය කල බවත් සිද්ධිය වන අවස්ථාවේ විරවංශ මහතා වාහනය තුල සිටි බවත්ය.

CMEV ආයතනය මගින් වීරවංශ මහතාගෙන් මේ පිලිබඳව විමසීමක් කල අතර ඔවුන් රැස්වීමකට සහභාගී වී පැමිණෙන අතරතුර ජ.වි.පෙ. ආධාරකරුවන් මාර්ගය අවහිර කර ඔහුගේ අංක 64-8027 දරණ මෝටර් රථයේ පැති කන්ණාඩියකට හානි කල බවයි. තවදුරටත් ඔහු පවසා සිටියේ දෙපිරිස අතර ගැටුකාම්රී තත්වයන් උද්ගත වූ බවත් තමන්ගේ ආධාරකරුවන් ඉවත් කරගෙන තත්වය සමථයකට පත් කල බවත්ය. කෙසේ නමුත් පිටබැද්ද පොලිස් ස්ථානය මගින් වාහන 02 ක් මොරවක පොලිසියේ උපදෙස් මත අත් අඩංගුවට ගෙන තිබුණ අතර පැය දෙකකට පසු වාහන දෙක යලින් ලබා දෙන ලදී.

මොරවක පොලිස් ස්ථානාධිපති ප්‍රභාත් දේශප්‍රිය මහතා ප්‍රකාශ කර සිටියේ රංජිත් නිශාන්ත නැමැති අය විසින් ඔක්තෝබර් මස 03 වන දින (EIB 01/2009) අංකය යටතේ පැමිණිල්ලක් කර ඇති බවයි. මේ අතර එම සිද්ධිය සම්බන්ධයෙන්ම එ.ජ.නි.ස. යේ අපේක්‍ෂක සරත් වීරවංශ මහතා විසින් පිටබැද්ද පොලිස් ස්ථානයට පැමිණිල්ලක් කර ඇත. ප්‍රභාත් දේශප්‍රිය මහතා තවදුරටත් ප්‍රකාශ කර සිටියේ මොරවක පොලිසිය මගින් පරීක්‍ෂණ කටයුතු කරගෙන යන බවත් අත් අඩංගුවට ගත් වාහන පොලිස් ඇප මත පිටබැද්ද පොලිසිය මගින් මුදාහැර ඇති බවත්ය.

මැතිවරණ දිනය ළඟා වන පසුබිම තුල උද්ගතවන මෙකී පක්‍ෂ අතර සහ පක්‍ෂ අභ්‍යන්තර පුද්ගල ගැටුම් කාරී තත්වය දකුණු පළාතේ දිස්ත්‍රික්ක 03 තුලම යම් දේශපාලන ප්‍රචණ්ඩත්වයක් ඇති වීමට හේතුවිය හැකි බවට CMEV ආයතනය සටහන් කර සිටී. එමනිසා ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රියාදාමයට සහ ප්‍රජාතන්ත්‍රවාදයට තර්ජනයක් වියහැකි ලෙසට ක්‍රියා කරන මැතිවරණ අපේක්‍ෂකයන්ගේ සහ ආධාරකරුවන්ගේ ප්‍රචන්ඩත්වය පාලනය කිරීම සඳහා අවශ්‍ය සෑම සියලු පියවරක්ම ගන්නා ලෙසට දේශපාලන පක්‍ෂ නායකයින්ගෙන්, මැතිවරණ කොමසාරස්තුමාගෙන් සහ පොලිසියෙන් CMEV ආයතනය ඉල්ලා සිටී.

මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය [CMEV] 1997 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය හා දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහි වූ සන්ධානය එකතුව මැතිවරණය හා සම්බන්ධ ප්‍රචණ්ඩත්වය ඇති වීම නිරීක්ෂණය සඳහා පිහිටුවා ගත් ස්වාධීන හා අපක්ෂපාතී සංවිධානයකි. දැනට මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය INFORM මානව හිමිකම් පිළිබඳ දත්ත කේන්ද්‍රය යන සංවිධාන වලින් සමන්විත වේ.



නීතිඥ තුසිත සිරිවර්ධන
ජාතික සම්බන්ධිකාරක